www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

බටහිර වර්ජිනියා පතල් කම්රුවන්ගේ අවමඟුලේදී

At memorial service for West Virginia miners

# ඔබාමා පතල් හිමියන් සමග සහජීවනය වෙනුවෙන් පෙනී සිටියි

Obama preaches reconciliation with coal bosses

ජෙරී වයිට් විසිනි

2010 අප්‍රේල් 26

බටහිර වර්ජිනියාවේ මොන්ටොකෝල්හි ඉහල මහා ශාඛා පතලේ අප්‍රේල් 5 වනදා සිදුවූ පිපිරීමෙන් මිය ගිය ගල් අඟුරු පතල් කම්කරුවන් 29 දෙනා වෙනුවෙන් ජනාධිපති බැරක් ඔබාමා 25 දින සිය ආචාරය පල කලේය. ආගමික සහ දේශප්‍රේමී පූච්ඡානම් වලින් පිරි මෙම අනුස්මරනයේ එල්ලය වූයේ මරන වලට ගල් අඟුරු පතල් හිමියන්ගේ සාපරාධී වගකීමත්, එම මර උගුල තුල වැඩ කිරීමට කම්කරුවන් දැක්කූ ෆෙඩරල් සහ රාජ්‍ය සංවිධානවල සම්බන්ධතාවයත් වසං කිරීම ය.

සහෝදර කම්කරුවන්, පවුල්වල සාමාජිකයන් හා වෙනත් පතල්වල කම්කරුවන් ඇතුලුව මිනිසුන් දෙදහසක් පමන තමන්ගේ අහිමි වූ ලබැඳියන් සහ සොහොයුරන්ට ගෞරව දැක්වීමට, විපත සිදුවූ ස්ථානයෙන් සැතපුම් 35 ක් පමන එහායින් පිහිටි බෙක්ලි සමුලු මධ්‍යස්ථානය වෙත පැමිනියහ. කෙසේ වුවද, ඔබාමා සහ ඩිමොක්‍රටික් පක්ෂයට තිබුනේ වෙනත් අරමුනු ය.

"බලාපොරොත්තුව සහ සුවපත් කිරීම" දිරි ගැන්වීමේ සේවයක් ලෙස වර්න ගන්වා තිබූ මෙම අනුස්මරනයේ ඉලක්කය වූයේ මැසේ බලශක්ති සහ අනෙකුත් පතල් හිමියන්ට එරෙහිව පතල් කම්කරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල පවත්නා කෝපය දිය කර හැරීමය. කථාබහ සමාදාන කිරීම සහ ක්ෂමාව පිලිබඳව විය. පතල් කනින්නෝ "ඇමෙරිකානු සිහිනය" ලුහුබැඳීමේ නිරතව සිටියදී මිය ගියහ යි ඔබාමා කීවේය.

"සමස්ත බටහිර වර්ජීනියාව ම වේදනාවෙන් පසුවන අතර ඒ තරමක කෝපයකින් තොරව ම නොවේ," යැයි එක්සත් ජනපද සෙනෙට් සභික ජේ රොකෆෙලර් ජනාධිපතිගේ කථාවට ප්‍රථමයෙන් ප්‍රකාශ කලේය. "එහෙත් අප ප්‍රජාවක් ලෙස එකට බැඳ තබනු ඇත. මන්ද යත් බටහිර වර්ජීනියානුවන් කරනු ලබන දෙය එය බැවිනි. ඉදිරියට යාමේ මාවතක් අපි සොයා ගන්නෙමු."

මෙය, ශ්‍රාවකයන් ඉදිරියේ වාඩිවී සිටි, පසුගිය දශකය පුරා සිය මෙහෙයුම්වල දී පතල් කම්කරුවන් 52 කගේ මරන වෙනුවෙන් වගකිව යුතු මැසේ බලශක්ති ප්‍රධාන විධායක නිලධාරී, දොන් බ්ලැන්කෙන්ෂිප් ඇතුලු ගල් අඟුරු පතල් ප්‍රධානීන් සමග "එකට බැඳෙන්නට" කල නිසැක ආයාචනයක් විය.

රොකෆෙලර්ට අමතරව, එක්සත් ජනපද සෙනෙට් සභික රොබර්ට් බයර්ඩ් සහ ආන්ඩුකාර ජෝ මැන්චින් යන ඩිමොක්‍රටිකයන් දෙදෙනා ද අවමඟුලට සහභාගි වී සිටියහ. බටහිර වර්ජීනියා ඩිමොක්‍රටිකයන්, සිය රිපබ්ලිකන් සහකරුවන් මෙන්ම, දීර්ඝ කාලයක් තිස්සේ ජීවත් වන්නේ විශාල ගල් අඟුරු ව්‍යාපාරිකයන්ගේ සාක්කු තුලය. සිය ආරක්ෂාව වෙනුවෙන් පුලුල් අරගලයක් දියත් කිරීමට ගල් අඟුරු කම්කරුවන් සැරසෙන විට, මෙම දේශපාලඥයන් ඉතා "දුෂ්කර සේවයේ නිරත - ගල් අඟුරු කම්කරුවන්" කෙරෙහි සිය අනුකම්පාව ක්ෂනිකව ම ඉවත ලා ඔවුන් අත් අඩංගුවට ගැනීමට රාජ්‍ය පොලිසිය මුදාහරිනු ඇත.

සිය ප්‍රකාශ තුලදී ජනාධිපති ඔබාමා, ගල් අඟුරු ක්ෂේත්‍ර තුල එකදිගට සිදුවන මරන සාධාරනීකරනය කිරීම සඳහා මාධ්‍ය මගින් පුන පුනා කියන ලද ස්වයං-නිර්මිත තේමාව, එනම් ඇපලාචියා ගල් අඟුරු පතලේ සේවය අනතුරුදායක වෘත්තියක් වන අතර විපත් යනු ජීවිතයේ සාමාන්‍ය කොටසක් පමනි, යන්න පුනපුනා කීවේය.

බොහෝ දිනවල, ඔවුන් ආලෝකයට ඇස් කුඩා කරගනිමින් අඳුරු පතල් තුලින් මතුවනු ඇත," ඔබාමා

ප්‍රකාශ කලේය. "බොහෝ දිනවල, දහඩිය පෙරාගෙන, අපිරිසිදුව, ඇඟ පුරා ගල් අඟුරු කුඩු ද සහිතව ඔවුන් මතුවනු ඇත. බොහෝ දිනවල, ඔවුන් නැවත ගෙදර පැමිනෙනු ඇත. බොහෝ දිනවල, නමුත් එම දිනයේ නම් නොවේ."

"ඔවුන්ට මෙන්ම ඔවුන්ගේ පවුල්වලට ද අනතුරක් තිබූ බව ඔවුහු දැන සිටියහ," ඔහු ප්‍රකාශ කලේය. "රාත්‍රියේ ඔවුන් පිට වීමට පෙර ඔවුන්ගේ දරුවන් යාඥාවක් කියන බව ඔවුහු දැන සිටියහ. තමන්ගේ වැඩ මුරය අවසන් වන විට හැම දේම හරි යැයි ඇමතුමක් ලැබෙන තෙක් සිය බිරින්දෑවරුන් මඟ බලා සිටිනු ඇති බව ඔවුහු දැන සිටියහ."

එබඳු පිලිගැන්වීමක් සැලසුම් කරනු ලැබුවේ ආකර තුල මරනීය කොන්දේසිවලට වගකිව යුතු සැබෑ පුද්ගලයින් සිටින්නේය යන කරුන වසන් කිරීමටය. ඉහල මහා ශාඛා පතලේ පිපිරීම - වසර 40 කින් මෙපිට නරකම ගල් අඟුරු ආකර විපත - "දෙවියන්ගේ පනතක්" නොව, එය, හැකිතරම් ගල් අඟුරු ප්‍රමානයක් ආකරයෙන් ඇදගැනීම ම අරමුනු කල, මැසේ කලමනාකරනයේ, වඩාත්ම මූලික ආරක්ෂක විධිවිධාන කෙරෙහි පැවතුනු තදබල නොසැලකිල්ලේ අනිවාරනීය ප්‍රථිඵලයකි. ඊටත් වඩා, ජනාධිපති විසින් ම පත් කරනු ලැබූ, ෆෙඩරල් ආකර ආරක්ෂක සහ සෞඛ්‍ය පරිපාලකයින්ද මෙයට වගකිව යුතුය. මක්නිසාද යත් වැඩිකල් නොගොස්ම සිදුවිය හැකි විපතක් පිලිබඳව ඇති තරම් අනතුරු ඇඟවීම් තිබියදී ම ඔවුන් ආකරයේ වැඩ කටයුතු කරගෙන යාමට ඉඩ දුන් හෙයිනි.

සමාගම්, ආකර කම්කරුවන්ගේ මරන දෙස බැලුවේ හොඳම මට්ටමේ ලාබ ලැබීමේ දී සිදුවූ හානිය ප්‍රාසංගික හානියකට මඳක් වැඩි දෙයක් ලෙසය. කෙසේ හෝ, ඔබාමාට අනුවනම්, පතල් කම්කරුවන් මිය ගියේ, "ඇමෙරිකානු සිහිනය" යථාර්තයක් කරගැනීමට වෑයම් කරමින් සිටින අතරතුරදීය.

සියලු දුෂ්කර කාර්යයන්. සියලු අසීරුතාවන්. මහපොලොව යට ගෙවුන සමස්ත කාලය. මේ සියල්ලම ඔවුන්ගේ පවුල් වෙනුවෙන් විය," ඔබාමා ප්‍රකාශ කලේය. මහමඟ දිවීමට මෝටර් රථයක්. හිසට වහලක්. මොහොතකටවත් සිය දරුවන් වෙනුවෙන් කාලය යොදවන්නට ඔවුන් දැන සිටියේ නැත. ඔවුහු විශ්‍රාම යාමෙන් සිය බිරින්දෑවරුන් සමග ප්‍රීති වෙති. ඒ වඩා හොඳ දෙයක් පිලිබඳ සියලු අපේක්ෂා තුලිනි. මෙම කම්කරුවන්  මිය ගියද, ඇමරිකානු සිහිනය පසුපසින් ඔවුහු ජීවත් වූහ."

ඔවුන් ජීවත් වූයේ සහ මියගියේ නපුරු ඇමරිකානු සිහිනයේ කොටසක් ලෙස  ප්‍රකාශ කිරීම වඩා අවංක වනු ඇත. මිසිසිපි සහ ලුවිසියානා වලට පමනක් පිටුපසින් ලැගගෙන සිටින, ජාතියේ තුන්වන දිලිඳු ම රාජ්‍යය වන බටහිර වර්ජීනියාව පුරා පැතිර පවත්නා දරිද්‍රතාවයෙන් ගැලවීමට, ප්‍රදේශයේ ආකර කම්කරුවන්ට තම ජීවිත තමන්ගේම අතට ගැනීමට බලකෙරී ඇත.

*නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පත සමග කල සම්මුඛ සාකච්ඡාවක දී ඉහල මහා ශාඛා ආකරයේ වැඩ ප්‍රධානියෙකු, සම්මත මට්ටමට වඩා සෑම දිනකම දෙගුනයක හෝ තෙගුනයක මට්ටමින් මීතේන් වායුව පවතින ආකරය තුල කම්කරුවන් මුහුන දෙන කුරිරු කොන්දේසි විස්තර කලේය. "දිනපතා උදෑසන වැඩට යන ඔබට කිසිදිනක ඔබගේ ජීවිතය සම්බන්ධයෙන් බියක් දැනී තිබෙනවාද? අන්න එය තමයි මෙහි සිදුවෙමින් පවතින්නේ. දිනපතාම. සමහර පිරිමි ලමුන් මා ලඟට ඇවිත් අඬලා තියනවා. වැඩුනු මිනිසෙකු හඬනුයේ බිය නිසා," යයි ඔහු ප්‍රකාශ කලේය.

මැසේහි ඉහල කලමනාකරනය පිලිබඳ විස්තර කරමින්, ඔහු මෙසේ ද පැවසීය. "ඒක ඇතුලේ ඉන්න කිසිවෙක් ගැන ඔවුන් තකන්නේ නැහැ. මට ඇහුනා ඔවුන් මෙසේ කියනවා. මිනිසෙකු කියන්නේ පරාල ඇනයක්. ඔබ ඔහු කැඩෙන තෙක්ම නවන්න. ඊට පසු වෙනත් අයෙකු ගන්න."

සැමරුමට සහභාගි වූ ආකර කම්කරුවන් සහ මිතුරන් මෙවැනිම අත්දැකීම් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* ප්‍රකාශ කලහ.

මැසේ විසින් නොතකා හරිනු ලැබූ මෙම වරද තහවුරු කරන සාක්ෂි හෝ සාමූහික ආරක්ෂක ප්‍රතිපාදන සහ ෆෙඩරල් පරිපාලකයින් ක්‍රියාත්මක නොවීම පිලිබඳව ජනාධිපති කොහෙත්ම සිය අවධානය යොමු නොකලේය. මෙම මරනීය කොන්දේසි ක්‍රියාත්මක වනු ඇත්තේ මැසේහි පමනක් නොව සමස්ත කර්මාන්තය පුරාම බව යහමින් දැන සිටින හෙතෙම තවදුරටත් ප්‍රකාශ කලේ "සිය ආකර කෙරෙහි විශ්වාසය තබන ජාතියක් ඔවුන් සුරැකීමට සිය බලය තුල හැමදෙයම නොකර සිටින්නේ කෙසේද? සරලව ම වැඩට යාම මගින් සිය ජීවිතය අනතුරේ හෙලා ගැනීමට මේ රටේ කිසිවකුට ඉඩදීමට අපට හැකිද? සරලව ම කිවහොත් ඇමරිකානු සිහිනය පසුපස යාම මගින්?

"අපට අහිමි වූ මිනිසුන් 29 දෙනා නැවත ලබා ගත නොහැක," ඔහු ප්‍රකාශ කලේය. "දැන් ඔවුන් දෙවියන් සමග ය. මේ මහපොලව මත අපේ කර්තව්‍ය වන්නේ තවත් එබඳු ඛේදවාචකයන්ගෙන් ජීවිත බේරා ගැනීමය. අප කල යුතු දේ වන්නේ, තනි තනිව සහ සාමූහිකව පොලව යට ආරක්ෂක තත්ත්වය සහතික කර ගැනීමයි. ඔවුන් එකිනෙකාට සලකන අයුරින් - හරියට පවුලක් මෙන් - අපේ ආකර කම්කරුවන්ට සැලකීමයි. ඒ අප හැමෝම එක පවුලක් සහ අප

සියල්ලො ඇමෙරිකානුවන් මෙන්ම අපට එකිනෙකාගෙන් ඉගෙනීමට තිබෙන නිසාත්ය.”

පතල් කම්කරුවන් එවන් ප්‍රකාශ බොහෝවිට අසා ඇත. බටහිර වර්ජිනියානු කම්කරුවන් 12 දෙනෙකුට මරු කැඳවූ සාගෝ පතලේ 2006 වර්ෂයේදී සිදුවූ විපතින් පසු, ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් දේශපාලඥයින් ආරක්ෂක තත්ත්වය වර්ධනය කිරීමටත් සිද්ධියට වගකිව යුතු පාලකයින් අල්ලා ගැනීමටත් දිව්රා පොරොන්දු විය. ඒ වෙනුවට, හිමිකරුවන්ට දඩගැසීම් වලින් බේරීයාමට සහ සිය අනාරක්ෂිත ආකරවල වැඩකටයුතු දිගටම කරගෙන යාමට විශාල හිදැසක් සපයනු ලැබූ පියවර ගනු ලැබීය. රිපබ්ලිකන් පරිපාලනයෙන් ඩිමොක්‍රටික් පරිපාලනයට සංක්‍රමනය වීම මගින් ව්‍යුහයේ කිසිදු වෙනසක් සිදුවී නැත.

ඔබාමාගේ ප්‍රකාශ පැහැදිලි කරනුයේ, ආකර කම්කරුවන් 29 දෙනාගේ මරන වෙනුවෙන්, මැසේ බලශක්තිය සහ එහි ප්‍රධාන විධායක නිලධාරී දොන් බ්ලැන්කෙන්ෂිප් ඇතුලු  වගකිවයුතු අය අල්ලා ගැනීමට කිසිදු උත්සාහයක් නොමැති බවයි. ෆෙඩරල් ආන්ඩුව මගින් දියත් කල විමර්ශනය හුදෙක්ම තවත් සුදුහුනු ගෑමක් වනු ඇත.

විවිධාකාර දේශපාලඥයින් සහ පුවත් මාධ්‍යයන් විසින් මැසේ වනාහී ආරක්ෂාකාරී සහ හොඳ ව්‍යාපාරයක "නරක් වූ ඇපල් ගෙඩියක්" වසයෙන් හුවා දැක්වීමට තැත් කරන අතරේ, අනෙකුත් පතල්වල ද මරන සහ තුවාල සිදුවෙමින් තිබේ.

23 දින බටහිර වර්ජිනියාවේ, බටහිර බෙක්ලි සිට සැතපුම් 8ක් දුරින් පිහිටි එකල්ස්හි අවුරුදු 28ක් වයසැති ආකර කම්කරුවෙක් නොනවත්වා දිවෙන පතල් හාරන යන්ත්‍රයකට සහ පතල් බිත්තියට හසුව චප්ප වී ගියේය. ආකරය අයත් වන්නේ සාගෝ ආකරය ද අයත් වන ජාත්‍යන්තර ගල් අඟුරු මන්ඩලයට ය.

© www.wsws.org